

# 24 වෘත්තයක ජ්‍යාය

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් ඔබට,

- "වෘත්තයක පිහිටි විෂ්කම්භයක් නොවන ජ්‍යායක මධ්‍ය ලක්ෂ්‍යය කේන්ද්‍රයට යා කරන සරල රේඛාව එම ජ්‍යායට ලම්බක වේ" යන ප්‍රමේයය සාධනය හා එම ප්‍රමේයය භාවිතයෙන් ගැටලු විසඳීමට
- "වෘත්තයක කේන්ද්‍රයේ සිට විෂ්කම්භය නොවන ජ්‍යායකට අඳින ලද ලම්බයෙන් එම ජ්‍යාය සමච්ඡේදනය වේ" යන ප්‍රමේයය භාවිතයෙන් ගැටලු විසඳීමට

හැකියාව ලැබේ.

## 24.1 හැඳින්වීම




### සටහන

- වෘත්තයක කේන්ද්‍රයේ සිට වෘත්තය (පරිධිය) මත ඕනෑ ම ලක්ෂ්‍යයක් යා කරන සරල රේඛා ඛණ්ඩයට අරය යැයි කියනු ලැබේ.
- වෘත්තය (පරිධිය) මත පිහිටි ඕනෑම ලක්ෂ්‍ය 2ක් යා කරන සරල රේඛා ඛණ්ඩයකට ජ්‍යායක් යැයි කියනු ලැබේ.
- වෘත්තයක කේන්ද්‍රය හරහා යන ජ්‍යාය විෂ්කම්භය ලෙස හැඳින්වේ. තවද එය දිගින් විශාලම ජ්‍යාය වන අතර එහි දිග අරය මෙන් දෙගුණයකි.

## ක්‍රියාකාරකම 1

**පියවර 1** - අරය 4.5 cm වන වෘත්තයක් ඇඳ එහි කේන්ද්‍රය $O$ ලෙස නම් කරන්න.

**පියවර 2** - දිග 6 cm වන ජ්‍යායක් ඉහත වෘත්තය මත ඇඳ එය $PQ$ ලෙස නම් කරන්න.

**පියවර 3** - $PQ$ ජ්‍යායේ මධ්‍ය ලක්ෂ්‍යය $X$ ලෙස ලකුණු කරන්න.

**පියවර 4** - $O\hat{X}P$ හි අගය මැන ලියන්න.




අරය හා ජ්‍යායේ දිග වෙනස් කරමින් ඉහත ක්‍රියාකාරකම නැවත සිදු කරමින්, ලබා ගත හැකි නිගමනය සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ප්‍රමේයය**

වෘත්තයක කේන්ද්‍රයත් විෂ්කම්භය නොවන ජ්‍යායක මධ්‍ය ලක්ෂ්‍යයත් යා කරන සරල රේඛාව එම ජ්‍යායට ලම්බ වේ.



ඉහත ප්‍රමේයය භාවිත වී ඇති පහත නිදසුන් පිළිබඳ ව හොඳින් අවධානය යොමු කරන්න.

**නිදසුන 1**

$O$ කේන්ද්‍රය වූ වෘත්තයක අරය 13 cm වේ. $AB$ යනු ඉහත වෘත්තය මත පිහිටි දිගින් 24 cm වූ ජ්‍යායකි. $AB$ හි මධ්‍ය ලක්ෂ්‍යය $X$ නම් $OX$ දිග සොයන්න.

ඉහත තොරතුරු පහත පරිදි රූප සටහනක දක්වමු.



ඉහත ප්‍රමේයයට අනුව $O\hat{X}B = 90^o$ වේ.

තවද $XB = \frac{24}{2} = 12$ cm ($X$ යනු $AB$හි මධ්‍ය ලක්ෂ්‍යය නිසා)

ඒ අනුව $OXB$ සෘජුකෝණික ත්‍රිකෝණයක් බැවින් පයිතගරස් ප්‍රමේයය යෙදීමෙන්,

$$OB^2 = OX^2 + XB^2$$
$$13^2 = OX^2 + 12^2$$
$$\therefore 169 = OX^2 + 144$$
$$169 - 144 = OX^2$$
$$25 = OX^2$$
$$OX^2 = 25$$
$$OX = \sqrt{25}$$
$$OX = 5 \text{ cm}$$

**නිදසුන 2**

$AB$ යනු $O$ කේන්ද්‍රය වූ වෘත්තයක ජ්‍යායකි. $AB = 8$ cm වන අතර $AB$ හි මධ්‍ය ලක්ෂ්‍යය $X$ වේ. දික් කළ $OX$, $C$ හි දී වෘත්තය හමුවන අතර $OX = 3$ cm නම් $CX$ හි දිග ගණනය කරන්න.




$BX = \frac{8}{2} = 4$ cm ($X$ යනු $A$හි මධ්‍ය ලක්ෂ්‍යය නිසා)

$O\hat{X}B = 90^o$ නිසා (ප්‍රමේයයෙන්)

$OXB\ \Delta$ ට පයිතගරස් ප්‍රමේයය යොදමු.

$$OB^2 = OX^2 + XB^2$$
$$OB^2 = 3^2 + 4^2$$
$$OB^2 = 9 + 16$$
$$OB^2 = 25$$
$$OB = \sqrt{25}$$
$$OB = 5 \text{ cm}$$
$$\therefore OC = 5 \text{ cm}$$ (වෘත්තයේ අරය)

ඒ අනුව, $CX = OC - OX$

$$= 5 - 3$$
$$= 2 \text{ cm}$$

## 24.1 අභ්‍යාසය

1. පහත රූප සටහන්වල දී ඇති දත්ත අනුව $x$ හි අගය සොයන්න. එක් එක් වෘත්තවල කේන්ද්‍රය $O$ වේ.

(i)




(ii)




(iii)




2. $C$ කේන්ද්‍රය වූ වෘත්තයක $PQ$ ජ්‍යායකි. $PQ$ ජ්‍යායේ මධ්‍ය ලක්ෂ්‍යය $X$ වේ. $PQ = 24$ cm ද $CX = 5$ cm ද නම් වෘත්තයේ අරය සොයන්න.

3. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක අරය 15 cm වේ. $XY$ යනු වෘත්තය මත පිහිටි ජ්‍යායකි. $XY$ හි මධ්‍ය ලක්ෂ්‍යය $P$ වේ. $OP = 12$ cm නම් $XY$ ජ්‍යායේ දිග සොයන්න.




4. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ හා $CD$ සමාන ජ්‍යාය 2 කි. $AB$ හා $CD$ හි මධ්‍ය ලක්ෂ්‍ය පිළිවෙළින් $X$ හා $Y$ වේ. $CD = 12$ cm හා $OY = 8$ cm වේ.

(i) වෘත්තයේ අරය සොයන්න.
(ii) $OX$ හි දිග සොයන්න.
(iii) $OX$ හා $OY$ අතර සම්බන්ධතාවක් ලියන්න.



**"වෘත්තයක කේන්ද්‍රයත් විෂ්කම්භය නොවන ජ්‍යායක මධ්‍ය ලක්ෂ්‍යයත් යා කරන රේඛාව එම ජ්‍යායට ලම්බක වේ" යන ප්‍රමේයය විධිමත්ව සාධනය කිරීම.**




දත්තය : $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ ජ්‍යායක් වේ. $AB$ හි මධ්‍ය ලක්ෂ්‍යය $X$ වේ.

සාධනය කළ යුත්ත : $AB$ට $OX$ ලම්බ බව

නිර්මාණය : $OA$ හා $OB$ යා කරන්න.

සාධනය : $AOX$ හා $OBX$ ත්‍රිකෝණවල

$AO = BO$ (එකම වෘත්තයේ අරය සමාන බැවින්)

$AX = BX$ ($AB$ පාදයේ මධ්‍ය ලක්ෂ්‍යය $X$ බැවින්)

$OX = OX$ (පොදු පාදය බැවින්)

$\therefore\ AOX\,\Delta \equiv OBX\,\Delta$ (පා.පා.පා. අවස්ථාව)

අංගසම ත්‍රිකෝණවල අනුරූප අංග සැලකීමෙන්

$O\hat{X}A = O\hat{X}B$

නමුත් $O\hat{X}A + O\hat{X}B = 180^{\circ}$ (සරල රේඛාවක් මත පිහිටි බද්ධ කෝණ)

$\therefore\ 2\ O\hat{X}A = 180^{\circ}$

$O\hat{X}A = \frac{180^{\circ}}{2}$

$O\hat{X}A = 90^{\circ}$

$\therefore$ $AB$ට $OX$ ලම්බ වේ.

**නිදසුන 3**

$O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ හා $CD$ සමාන ජ්‍යා 2කි. $AB$ හා $CD$හි මධ්‍ය ලක්ෂ්‍ය පිළිවෙළින් $X$ හා $Y$ වේ.

(i) $OX = OY$ බව සාධනය කරන්න.

(ii) දික්කළ $BA$ හා $DC$ වෘත්තයට පිටතින් වූ $P$හි දී හමු වේ. $BP = DP$ බව සාධනය කරන්න.

(i) ගැටලුවට අදාළ දත්තයන් පහත පරිදි රූප සටහනක දැක්විය හැකි ය.




**දත්තය** : $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ හා $CD$ සමාන ජ්‍යා 2කි. $AB$ හා $CD$හි මධ්‍ය ලක්ෂ්‍ය පිළිවෙළින් $X$ හා $Y$ වේ.

**සාධනය කළ යුත්ත** : $OX = OY$ බව

**සාධනය** : $O\hat{X}A = O\hat{Y}C = 90^{o}$ (ජ්‍යායක මධ්‍ය ලක්ෂ්‍යය කේන්ද්‍රයට යා කරන රේඛාව එම ජ්‍යායට ලම්බක නිසා)

දැන් $AB = CD$ (දත්තය)

$$\frac{AB}{2} = \frac{CD}{2}$$

$\therefore AX = CY$ ($AB$හි මධ්‍ය ලක්ෂ්‍යය $X$ ද $CD$හි මධ්‍ය ලක්ෂ්‍යය $Y$ ද වන නිසා)

දැන් $AXO$ හා $CYO$ ත්‍රිකෝණවල

$AO = OC$ (එකම වෘත්තයේ අරය සමාන නිසා)

$O\hat{X}A = O\hat{Y}C = 90^{o}$

$AX = CY$ (සාධිතයි.)

$\therefore AXO\,\Delta \equiv CYO\,\Delta$ (කර්ණ. පා. අවස්ථාව)

අංගසම ත්‍රිකෝණවල අනුරූප අංග සැලකීමෙන්
$OX = OY$ වේ.

(ii)




දත්තය : දික්කළ $BA$ හා $DC$ වෘත්තයට පිටතින් වූ $P$හි දී හමු වේ.

සාධනය කළ යුත්ත : $PB = PD$ බව

නිර්මාණය : $OP$ යා කර ඉහත පරිදි රූප සටහනක දක්වමු.

සාධනය : $POX$ හා $POY$ ත්‍රිකෝණවල

$PO = PO$ (පොදු පාදය)

$OX = OY$ (සාධිතයි.)

$O\hat{X}P = O\hat{Y}P = 90^{o}$

$\therefore POX\,\Delta \equiv POY\,\Delta$ (කර්ණ. පා. අවස්ථාව)

අංගසම ත්‍රිකෝණවල අනුරූප අංග සැලකීමෙන්

$PX = PY$

නමුත් $BX = DY$ (ඉහත පරිදි)

$PX + BX = PY + DY$

$PB = PD$

## 24.2 අභ්‍යාසය

1. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ හා $BC$ යනු එකිනෙකට ලම්බ වූ සමාන ජ්‍යාය 2කි. $AB$ හා $BC$ මධ්‍ය ලක්ෂ්‍යය පිළිවෙළින් $P$ හා $Q$ වේ. $OPBQ$ සමචතුරස්‍රයක් බව සාධනය කරන්න.




2. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $XY$ ජ්‍යායකි. $XY$හි මධ්‍ය ලක්ෂ්‍යය $C$ වේ. දික්කළ $OC$ වෘත්තය මත $P$හි දී හමු වේ. $OC = CP$ නම් $OY = YP$ බව සාධනය කරන්න.




3. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $XY$ ජ්‍යායකි. $XY$හි මධ්‍ය ලක්ෂ්‍යය $P$ වේ. $O\hat{Y}P = 45^o$ නම් $POY$ සමද්විපාද ත්‍රිකෝණයක් බව සාධනය කරන්න.

4. රූපයේ දැක්වෙන්නේ $O$ කේන්ද්‍රය වූ ඒක කේන්ද්‍රීය වෘත්ත 2කි. $AB$ යනු විශාල වෘත්තය මත ජ්‍යායක් වන අතර එය කුඩා වෘත්තය $C$ හා $D$හි දී හමු වේ. $CD$හි මධ්‍ය ලක්ෂ්‍යය $X$ වේ. $AXO\ \Delta$ වර්ගඵලය: $DXO\ \Delta$ වර්ගඵලය $= AX : XD$ බව සාධනය කරන්න.



5. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $PQ$ ජ්‍යායක් වේ. $PQ$ හා මධ්‍ය ලක්ෂ්‍යය $X$ වේ. දික්කළ $PO$, වෘත්තය $R$ හි දී හමු වේ. $X\hat{O}Q = 30^o$ නම් $PQR$ සෘජුකෝණියක් බව පෙන්වන්න.




## 24.2 ප්‍රමේයයේ විලෝමය හා එහි භාවිතය

**ප්‍රමේයය**

වෘත්තයක කේන්ද්‍රයේ සිට විෂ්කම්භය නොවන ජ්‍යායකට අඳිනු ලබන ලම්බයෙන් එම ජ්‍යාය සමච්ඡේදනය වේ.






$O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ ජ්‍යායකි.

$OX$, $AB$ ට ලම්බ වේ නම්, $AX = XB$ වේ.

**නිදසුන 1**

$O$ කේන්ද්‍රය වූ වෘත්තයක අරය 10 cm වේ. වෘත්තය මත පිහිටි $AB$ ජ්‍යායේ දිග 16 cm වේ. $AB$ ට ලම්බකව $OX$ ඇඳ ඇත. $OX$ දිග සොයන්න.

ඉහත දත්ත පහත පරිදි රූප සටහනක දක්වමු.




$AB = 16$ cm (දී ඇත.)

$\therefore AX = XB = \frac{16}{2} = 8$ cm (ලම්බයෙන් ජ්‍යාය සමච්ඡේදනය වන නිසා)

දැන් $OXB$ $\Delta$ට පයිතගරස් ප්‍රමේයය යෙදීමෙන්,

$OB^2 = OX^2 + XB^2$

$10^2 = OX^2 + 8^2$

$100 = OX^2 + 64$

$100 - 64 = OX^2$

$36 = OX^2$

$\sqrt{36} = OX$

$\therefore OX = 6$ cm

නිදසුන 2

$O$ කේන්ද්‍රය වූ ඒක කේන්ද්‍රීය වෘත්ත 2කි. විශාල වෘත්තය මත පිහිටි $AB$ ජ්‍යාය කුඩා වෘත්තය $P$ හා $Q$හි දී ඡේදනය කරයි. $OX$ , $AB$ ට ලම්බක වේ.

$AP = QB$ බව ද $AOP\,\Delta \equiv BOQ\,\Delta$ බව ද සාධනය කරන්න.

ඉහත ගැටලුවලට අදාළ දත්ත පහත පරිදි රූප සටහනක ඇතුළත් කරමු.




**දත්තය** : $O$ කේන්ද්‍රය වූ ඒක කේන්ද්‍රීය වෘත්ත 2කි. විශාල වෘත්තය මත පිහිටි $AB$ ජ්‍යාය කුඩා වෘත්තය $P$ හා $Q$හි දී ඡේදනය කරයි. $OX$ , $AB$ ට ලම්බක වේ.

**සාධනය කළ යුත්ත** : $AP = QB$ බව හා $AOP\,\Delta \equiv BOQ\,\Delta$ බව

**සාධනය** : $OX$ , $AB$ ට ලම්බක නිසා

$AX = XB$ වේ. (ලම්බකයෙන් ජ්‍යාය සමච්ඡේද වන බැවින්)

ඉහත පරිදි ම $PQ$ හා $OX$ ද ලම්බ බැවින්,

$PX = XQ$ වේ.

$\therefore\ AX - PX = XB - XQ$

ඒ අනුව, $AP = QB$

$AOP$ හා $BOQ$ ත්‍රිකෝණවල

$AP = QB$

$OP = OQ$ (එකම වෘත්ත අරය සමාන බැවින්)

$OA = OB$ (එකම වෘත්ත අරය සමාන බැවින්)

$\therefore\ AOP\,\Delta \equiv BOQ\,\Delta$ (පා.පා.පා. අවස්ථාව)

## 24.3 අභ්‍යාසය

1. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක අරය 17 m වේ. වෘත්තය මත $AB$ ජ්‍යායක් පිහිටා ඇත. $AB$ මත $X$ පිහිටා ඇත්තේ $OX$ හා $AB$ ලම්බ වන පරිදි ය. $OX = 8$ cm නම් ජ්‍යායේ දිග සොයන්න.

2. $C$ කේන්ද්‍රය වූ වෘත්තය $XY$ හා $PQ$ සමාන්තර ජ්‍යාය දෙකකි. $XY = 40$ cm හා $PQ = 48$ cm වේ. වෘත්තයේ අරය 25 cm නම් $XY$ හා $PQ$ අතර ලම්බ දුර සොයන්න.




3. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ ජ්‍යායකි. $AB$ මත $X$ පිහිටා ඇත්තේ $OX$, $AB$ ට ලම්බක වන පරිදි ය. දික්කළ $XO$ රේඛාව $Y$ හි දී වෘත්තය හමුවේ. $AYB$ සමද්විපාද ත්‍රිකෝණයක් බව සාධනය කරන්න.




4. $O$ හා $A$ කේන්ද්‍ර වන අරයන් සමාන වෘත්ත දෙකක් $X$ හා $Y$හි දී ඡේදනය වේ. $OA$ට සමාන්තර ලෙස $X$ හරහා ඇඳි සරල රේඛාවක් වෘත්ත දෙක පිළිවෙළින් $P$ හා $Q$හි දී හමු වේ. $PQ$ රේඛාව මත $L$ හා $M$ පිහිටා ඇත්තේ $OL$, $PX$ ට ලම්බක හා $AM$, $XQ$ ට ලම්බක වන පරිදි ය.

(i) $OX$ හා $AX$ යා කර, $OLX\,\Delta \equiv OQX\,\Delta$ බව
(ii) $PX = XQ$ බව සාධනය කරන්න.




## මිශ්‍ර අභ්‍යාසය

1. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $PQ$, $QR$ හා $PR$ ජ්‍යායන් තුනකි. $PQ$, $QR$ හා $PR$ ජ්‍යායන්ට $O$ සිට ඇඳි ලම්බයන් පිළිවෙළින් $OX$, $OY$ හා $OZ$ වේ.

(i) $OQ$ යා කළ විට, $OQX\,\Delta \equiv OYQ\,\Delta$ බව
(ii) $PQ = QR$ බව
(iii) $PQR$ සමපාද ත්‍රිකෝණයක් බව
සාධනය කරන්න.

2. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ හා $AC$ ජ්‍යායන් දෙකකි. $AB$ හා $AC$ ට කේන්ද්‍රයේ සිට ඇඳි ලම්බයන් පිළිවෙළින් $OX$ හා $OY$ වේ.

$OX^2 - OY^2 = \frac{1}{4}\ (AC^2 - AB^2)$ බව සාධනය කරන්න.




3. $O$ කේන්ද්‍රය වූ වෘත්තයක $AB$ හා $AC$ ජ්‍යායන් දෙකකි. $O$ සිට $AB$ ට හා $AC$ ට අඳින ලම්බ පිළිවෙළින් $OX$ හා $OY$ වේ. $CX$ හා $BY$ සරල රේඛා නම් $CX = BY$ බව සාධනය කරන්න.




4. රූපයේ දැක්වෙන්නේ වෘත්ත චාපයකි. මීට අදාළ වෘත්තයේ කේන්ද්‍රය පිහිටි ස්ථානය සොයා ගැනීමට සුදුසු ක්‍රමයක් සඳහන් කර රූප සටහනේ ලකුණු කර දක්වන්න.



5. $PQ$ හා $PR$ යනු $O$ කේන්ද්‍රය වූ වෘත්තයක ජ්‍යායන් දෙකකි. $O$ සිට $PR$ ට අඳින ලද ලම්බය $OX$ වේ. $PQ = PX$ නම් $PR = 2PQ$ බව සාධනය කරන්න.




**සාරාංශය**

- වෘත්තයක කේන්ද්‍රයත් විෂ්කම්භය නොවන ජ්‍යායක මධ්‍ය ලක්ෂ්‍යයත් යා කරන රේඛාව එම ජ්‍යායට ලම්බ වේ.
- වෘත්තයක කේන්ද්‍රයේ සිට විෂ්කම්භය නොවන ජ්‍යායකට අඳිනු ලබන ලම්බයෙන් එම ජ්‍යාය සමච්ඡේදනය වේ.